# <u>කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය</u>

## <u>කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් ගිහාන් පිලපිටිය මැතිතුමන් ඉදිරිපිට දිය</u>.

( වාර්තා කලේ- වමල්කා කල්පනි )

නඩු අංකය : 25448/1/14 29 FEB 2016 දිනය: 2016.02.19

විත්තිකාරිය සිටි.

විත්තිකාරිය වෙනුවෙන් නිතිඥ පොල් රත්නායක නිතිඥ සමාගමේ උපදෙස් මත නිතිඥ යූ.එල්.බී.බණ්ඩාර, ගුණරත්න වන්නායක, සුගත් කල්දේරා, නිලන්ති පිරිස් මහත්මිය සමග ජනාධිපති නිතිඥ නලින් ලද්දුවහෙට්ටි මහතා පෙනි සිටිනවා.

පැමිණිල්ල වෙනුවෙන් සුහානි සිරිවර්ධන මහත්මිය සමග රජයේ ජොෂ්ඨ අධි නිතිඥ ඩිලාන් රත්නායක මහතා පෙනි සිටි.

මෙම අවස්ථාවේ පැමිණිල්ල වෙනුවෙන් දන්වා සිටින්නේ,

විත්තිකාරිය වෙනුවෙන් කරන ලද සැලකිරිම් සළකා බලා මේ අවස්ථාවේ දී පැමිණිල්ල ඉල්ලා අස් කර ගැනිමට මෙම නඩු තුනම සම්බන්ධයෙන් අවසර ඉල්ලා සිටිනවා.

විත්තිකාරිය වෙනුවෙන් ජනාධිපති නීතිඥ මහතා නඩු ඉල්ලා අස් කර ගැනීම සම්බන්ධයෙන් විරුද්ධ නොවන බව දන්වා සිටී.

29 FEB 2016

නියෝගය.

මෙම අවස්ථාවේ දී පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටින රජයේ ජ්‍යෙෂ්ඨ අධි නීතිඥ මහතා මෙම නඩුව ඉල්ලා අස් කර ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමට අවසර දෙමි. ඒ අනුව චූදිත නිදොස් කර නිදහස් කරමි.

චූදිත සම්බන්ධයෙන් පනවා ඇති සියළු තහනම් නියෝග අවලංගු කරමි. විදේශ ගමන් තහනම අවලංගු කළ බව ආගමන හා විගමන පාලක වෙත වහාම දන්වා යැවීමට නියම කරමි. චූදිතගේ විදේශ ගමන් බලපත්‍රය චූදිත වෙත අද දිනම මුදා හැරීමට නියම කරමි.

ඇපකරුවන් ද මුදා හරින අතර ඇප මුදල් ඇත්නම් ඒවාද මුදා හරිමි. නඩු කටයුතු අවසන් කරමි.

අත්/කලෙේ

ප්‍රධාන මහෙස්ත්‍රාත්

ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය

2016.02.19

---------------------------

ඉහත සඳහන් වන්නේ කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ අංක 01 අධිකරණයේ 25448/1/15 දරණ නඩුවේ අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල් ඉදිරිපත් කරනු ලබන වාර්තාහො 2016.02.19 දින නියෝගයේ සහතික පිටපතකි. ( මෙය රාජකාරී පිටපතක් බැවින් ගාස්තු රහිතව නිකුත් කරන්න )

සැකසුවේ ;

සැසඳුවේ :

රෙජිස්ට්‍රාර්

ප්‍රධාන රෙජිස්ට්‍රාර්
ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය
කොළඹ-12